පීඨාධිපති කාර්යාලය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
UNIVERSITY OF SRI JAYEWARDENEPURA
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
FACULTY OF MANAGEMENT STUDIES AND COMMERCE

ගංගොඩවිල - නුගේගොඩ
ශ්‍රී ලංකාව
Gangodawila - Nugegoda,
Sri Lanka.

දුරකථන / Telephones: Direct : + 94 11 2803343
General : + 94 11 2758000
Extension No: 3001, 3002

ෆැක්ස් / Fax: +94 11 2803653

E-Mail / ඊ තැපැල්: dofmsc@sjp.ac.lk

07.01.2025

Dear Students,

I congratulate you and warmly welcome you to the academic year 2023/2024 of the Faculty of Management Studies and Commerce (FMSC), University of Sri Jayewardenepura. It is with great pride that I state only the best of the best, with determination, commitment and forbearance while obtaining the highest results at the G.C.E. Advanced Level examination in the commerce stream, are capable of overcoming this challenge to enter our Faculty.

I, thus, welcome you to a prominent faculty of a prestigious university. The FMSC of the University of Sri Jayewardenepura is the first management faculty in Sri Lanka. During a period of about seven decades, as the pioneer and the *Center of Excellence in Management Education*, the Faculty has produced many renowned graduates. It is with great pleasure that I mention of our alumni who have brought fame and prestige to our university, both locally and internationally. My faculty and I sincerely hope and wish that you too will rise up to this distinguished community of graduates.

During your stay at the Faculty, you will not only receive academic knowledge but you will also obtain skills, positive attitudes as well as training to apply the theoretical knowledge in practical scenarios. Furthermore, you will gain much experience that will nurture your entire life.

As a fulltime undergraduate of the FMSC, which functions through the tax paid by the people of Sri Lanka, the foremost attitude that you should possess is ‘this is my faculty, this is my university; this is my country’. The priority of your hierarchy of needs should be to obtain the greatest possible advantage of the University while studying to the best of your ability. You should never forget that your prime responsibility is to become an outstanding graduate of this esteemed Faculty and carry forward its honor and greatness.

I sincerely wish you perseverance and determination to reap the best out of this golden opportunity to realize your and your parents’ dream and as well as the expectations of the taxpayers of the country.

Prof. Dushan Jayawickrama
Dean
Faculty of Management Studies and Commerce

පීඨාධිපති කාර්යාලය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
UNIVERSITY OF SRI JAYEWARDENEPURA

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
FACULTY OF MANAGEMENT STUDIES AND COMMERCE

ගංගොඩවිල - නුගේගොඩ
ශ්‍රී ලංකාව
Gangodawila - Nugegoda,
Sri Lanka.

දුරකථන / Telephones: Direct : + 94 11 2803343
General : + 94 11 2758000
Extension No: 3001, 3002

ෆැක්ස් / Fax: +94 11 2803653

E-Mail / ඊ තැපැල්: dofmsc@sjp.ac.lk

2025.01.07

දයාබර ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ 2023/2024 අධ්‍යයන වර්ෂයට ප්‍රවේශ වූ ඔබට සුබ පතමින්, අප පීඨය වෙත ඉතා ආදරයෙන් පිළිගනිමි. ඉතා තරඟකාරී අ.පො.ස. උසස් පෙළ විභාගයේ වාණිජ විෂය ධාරාවේ ඉහළම කුසලතා දක්වමින් අප පීඨයට ඇතුළත් වීමේ අභියෝගය ජයගත හැකි වන්නේ අධිෂ්ඨානශීලී, කැපවීම් කළහැකි, විඳදරා ගැනීමේ හැකියාව ඇති විශිෂ්ටයන් අතරින් අතිවිශිෂ්ටයෙකුට පමණක් බව සිහිපත් කිරීමට කැමැත්තෙමි.

මා මෙසේ ඔබ පිළිගනු ලබන්නේ කීර්තිමත් විශ්වවිද්‍යාලයක කීර්තිමත් පීඨයක් වෙත ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ලංකාවේ ප්‍රථම කළමනාකරණ පීඨයයි. එය අප රටේ කළමනාකරණ අධ්‍යාපනයේ පුරෝගාමියා සහ විශිෂ්ටයා ලෙස වසර හැත්තෑවකට ආසන්න කාලයක් තිස්සේ සමාජයට දායාද කර ඇති කීර්තිමත් විද්‍යාර්ථීන් පිරිස අතිවිශාලය. මේ විද්‍යාර්ථීන් අද වන විට අප රට පමණක් නොව ජාත්‍යන්තරය පවා ජයගෙන අපගේ විශ්වවිද්‍යාලයේ නාමය ඉහළින්ම ඔසවා තබා ඇති බව සනිටුහන් කරන්නේ දැඩි සතුටකිනි. මාගේත් අපගේ ආචාර්ය මණ්ඩලයේත් ඒකායන ප්‍රාර්ථනය ඔබ ද ඒ කීර්තිමත් විද්‍යාර්ථීන්ගේ ප්‍රජාවට එකතු වනු දැකීමයි.

මෙම පීඨය තුළ දී විෂය දැනුම පමණක් නොව, හෙට දින ලොව ජය ගන්නට අවශ්‍ය කුසලතා, ධනාත්මක සහ ගුණාත්මක ආකල්ප මෙන්ම න්‍යායන් ප්‍රායෝගිකව යොදා ගැනීමට අවශ්‍ය පුහුණුව ද ඔබට ලැබෙනු ඇත. ඊට අමතරව ජීවිතයට අවශ්‍ය අත්දැකීම් සම්භාරයකින් ද ඔබ පෝෂණය වනු නොඅනුමානය.

මහජනතාවගේ බදු මුදලින් නඩත්තුවන අප විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට පූර්ණකාලීන උපාධි අපේක්ෂකයෙකු ලෙස පිය නඟන ඔබ පළමුව සිත්හි ධාරණය කර ගත යුතු ආකල්පය නම් “මේ මගේ පීඨය, මේ මගේ විශ්වවිද්‍යාලය, මේ මගේ රට” යන හැඟීමයි. ඔබගේ අවශ්‍යතා ධූරාවලියේ අංක එක බවට පත්විය යුත්තේ හොඳින් අධ්‍යාපනය ලබමින් විශ්වවිද්‍යාල ජීවිතයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම යි. ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ටතම පීඨයේ විශිෂ්ට උපාධිධාරියෙකු බවට පත්වී පීඨයේ කීර්තිනාමය ඉදිරියට ගෙන යෑමේ වගකීම ඔබ සතු බව කිසි දිනක අමතක නොකල යුතුය.

ඔබ ලබාගත් මෙම දුර්ලභ අවස්ථාවෙන් උපරිම ඵල නෙළා ගනිමින් ඔබගේත්, ඔබගේ ආදරණීය දෙමව්පියන්ගේත්, ඔබ වෙනුවෙන් බදු මුදල් ගෙවන ජනතාවගේත් බලාපොරොත්තු මල්ඵල ගැන්වීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය සර්වප්‍රකාරයෙන් ලැබේවා යි සෙනෙහසින් ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය දුෂාන් ජයවික්‍රම
පීඨාධිපති
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය